අභ්‍යන්තර චක්‍රලේඛ අංක : 03/2023

මගේ අංකය :- BD/GH/CPHMA/01/2013,
ශික්ෂණ රෝහල,
බදුල්ල.

2023.07. 5

සියලුම වි. වෛද්‍යවරුන් / සියලුම වෛද්‍යවරුන්
ඒකක/ අංශ ප්‍රධානීන් මගින් සියලුම කාර්ය මණ්ඩලය

**පශ්චාත් මරණ පරීක්ෂණ වලට යොමු කළ යුතු මරණ වලදී රෝහල් කර්ය මණ්ඩල අනිසි බලපෑම් සිදු කිරිම**

රෝහල තුල සිදුවන මරණ වල පශ්චාත් මරණ පරීක්ෂණ වලට යොමු කළ යුතු මරණ සම්බන්ධව රෝහල් පොලිසිය හා හදිසි මරණ පරීක්ෂකවරුන් වෙත රෝහල් කාර්ය මණ්ඩලයෙන් අනිසි බලපෑම් ඒල්ල වන බවට ඔවුන් විසින් අධිකරණ වෛද්‍යවරුන් දැනුවත් කිරිමෙන් පසු අදාල පාර්ශ්වයන් එක්ව පශ්චාත් මරණ පරීක්ෂණ සිදු කරනු ලබන ආකාරය පිළිබඳව මාර්ගෝපදේශ මා වෙත ඉදිරිපත් කර ඇත.

02. ඒ අනුව පහත උපදෙස් පරිදි අදාල නිලධාරීන් කටයුතු කල යුතු බව හා සමස්ථ ක්‍රියාවලියේදී අනිසි බලපෑම් සිදු කිරීමෙන් වලකින ලෙස අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත ද මින් දන්වමි.

- වාට්ටුවකදී හෝ විශේෂ ඒකකයක් තුලදී සිදුවන මරණයක්, පශ්චාත් මරණ පරීක්ෂණයකට භාජනය කළ යුතු බව විශේෂඥ වෛද්‍යවරයා හෝ වෛද්‍යවරුන් තීරණය කර අධ්‍යක්ෂ හෝ අධ්‍යක්ෂ බලය අභිනියෝජනය කරන අයෙකුගේ නිර්දේශය මත අදාල මරණකරුගේ ඇඳුම්පත රෝහල් පොලිසිය වෙත යොමු කර තිබේ නම් නැවත එම ඇඳුම්පත වෙනස් කළ හැකි වන්නේ (එනම් මරණ පරීක්ෂණය සිදුකිරීම අවශ්‍ය ද, අවශ්‍ය නොවේ ද යන්න) රෝහල් පොලිසිය, හදිසි මරණ පරීක්ෂක හා අධිකරණ වෛද්‍ය ඒකකයේ වෛද්‍යවරුන්ගේ සාකච්ඡාමය එකඟතාවයෙන් තීරණය වුවහොත් පමණි.

03. එමෙන්ම තව දුරටත් පශ්චාත් මරණ පරීක්ෂණ සිදු කිරීම් වලට රෝහල් සේවයේ නියුතු නිලධාරීන් විසින් අනිසි බලපෑම් සිදු කිරිමේ අවස්ථා වාර්තා වුවහොත් එවැනි අයට විරුද්ධව විනයානුකූල/ නීත්‍යානුකූල ක්‍රියා මාර්ග ගන්නා බව ද වැඩි දුරටත් දන්වමි.

Dr. Upul Karunarathne
MBBS.MSc (Med.Admin) MD(Med.Admin)
Director
Teaching Hospital, Badulla.

අධ්‍යක්ෂ,
ශික්ෂණ රෝහල,
බදුල්ල.

පිටපත් :-
01. විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරි
02. හදිසි මරණ පරීක්ෂක නිලධාරීන්
03. ස්ථානාධිපති, රෝහල් පොලිසිය